මාධ්‍ය නිවේදනය
2018.දෙසැම්බර්.09

**(2018 දෙසැම්බර් 10 ජගත් මානව හිමිකම් දිනය නිමිත්තෙනි)**
**මානව හිමිකම් සැමරුමට ඇති සුදුසුම මඟ ප්‍රජාතන්ත්‍රවාදය දිනවීමයි**
**-නිදහස් මාධ්‍ය ව්‍යාපාරය**

ජගත් මානව හිමිකම් ප්‍රකාශනයට හැත්තෑ වසරක් සපිරෙන මේ මොහොතේ ශ්‍රී ලංකාව මානව හිමිකම් හා ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් තියුණු අභියෝගයකට මුහුණ දී සිටින බව තේරුම් ගෙන, එම අභියෝග ජය ගැනීමට සමස්ත සමාජයේම අවධානය යොමු විය යුතුව ඇති බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විශ්වාස කරයි.

ගෙවී ගිය හැත්තෑ වසර තුළ, මානව හිමිකම් ආරක්ෂා කොට පෝෂණය කිරීම පිණිස ජාතික වශයෙන් මෙන්ම ජාත්‍යන්තරව ද තබනු ලැබූ සෑම පියවරක් දෙසම ආපසු හැරී බැලීමටත්, අනාගතය වඩා යහපත් කර ගැනීම සඳහා සූදානම් වීමටත් යොදා ගත යුතු දිනයක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය මෙම දිනය සලකයි.

මෙතෙක් ලබා ගෙන ඇති ජයග්‍රහණ තහවුරු කර ගනිමින් නව අරමුණු කරා යොමු විය යුතු අවස්ථාවක, ශ්‍රී ලාංකික සමාජය තුළ මෙතෙක් ලබා ඇති ජයග්‍රහණ පවා අවදානමට ලක් ව තිබීම අවාසනාවන්ත තත්ත්වයකි.

පවතින තත්ත්වය බැලූ බැල්මට ව්‍යවස්ථාමය අර්බුදයක් ලෙස පෙනෙන්නට ඇති නමුත්, මේ වන විට එම අර්බුදය ඉන් ඔබ්බට පැතිර ගොස් තිබේ. සමාජ දේශපාලන හා ආර්ථික යන සියලු ක්ෂේත්‍ර වෙත මෙම අර්බුදය පැතිර ගොස් ඇති අතර වඩා දරුණු ලෙස බලපා ඇත්තේ මෙරට ප්‍රජාතන්ත්‍රවාදී සංස්කෘතිය කෙරෙහිය.

නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වැනි මෙරට මාධ්‍ය නිදහස මෙන්ම මානව අයිතිවාසිකම් හා ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් කටයුතු කරන සංවිධානයක දෘෂ්ටිකෝණයෙන් බලන විට අද රට ඉදිරියේ ඇත්තේ බරපතල අවදානමක් බව කිව යුතුය.

එවැනි පසුබිමක් තුළ අද දවසේ මෙරට මාධ්‍ය නිදහස ඇතුළු මානව හිමිකම් සංස්කෘතිය මුහුණ දී සිටින අභියෝග ජය ගෙන වඩා යහපත් අනාගතයක් ගොඩ නැගීමට දායක වීම මානව හිමිකම් ප්‍රකාශනයේ හැත්තෑවන සංවත්සරය අනුස්මරණය කිරීමට ඇති සුදුසුම මඟ බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය කියා සිටියි.

**සී.දොඩාවත්ත**
**කැඳවුම්කරු**

**Free Media Movement**
**Convener** | C. Dodawatta +94 777270063 **Secretary** | Dileesha Abesundara +94 772992597 **Treasurer** | Ananda Jayasekera +94773124850
No 96, Kirula Road, Colombo 05. **Tel**: +94 112368895 **Fax**: +94 112368895;
**Email**: fmmsrilanka@gmail.com | **Facebook** https://www.facebook.com/freemediamovementsl/
**Twitter**: https://twitter.com/FMMsrilanka | **#FMM25**